# ජාතික ලුණු සමාගම

## කර්මාන්ත අමාත්‍යාංශය

ජාතික ලුණු සමාගම යනු කර්මාන්ත අමාත්‍යාංශයේ විෂය පථය යටතේ ඇති රජය සතු සමාගමකි. කොළඹ - ප්‍රධාන කාර්යාලයේ ස්ථිර පදනම මත සේවය කිරීමට පහත සඳහන් තනතුර සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

## අභ්‍යන්තර විගණක - (MM 1-1)

**(තනතුරු - 01 - ප්‍රධාන කාර්යාලය)**

**අවශ්‍ය සුදුසුකම් :**

**බාහිර අපේක්ෂකයන්**

01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වාණිජ / ගණකාධිකරණ / ව්‍යාපාර කළමනාකරණ / ව්‍යාපාර පරිපාලන උපාධියක් සහිතව ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් පසුව රාජ්‍ය සේවයේ, සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක / ආයතනයක හෝ පිළිගත් පුද්ගලික ආයතනයක අවම වශයෙන් වසරක (01) පශ්චාත් සුදුසුකම් පළපුරුද්දක් තිබීම

හෝ

02. තනතුරට අදාළ වන විෂය ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක අන්තර් මධ්‍යම විභාගය සමත් වී තිබීම සමග තනතුරට අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසරක (01) පශ්චාත් සුදුසුකම් පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අපේක්ෂකයන්**

01. ඉහත සඳහන් බාහිර අපේක්ෂකයන් සඳහා අවශ්‍යවන සුදුසුකම් ලබා තිබීම

හෝ

02. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ කනිෂ්ඨ කළමනාකරු (JM) කාණ්ඩයේ තනතුරක අවම වශයෙන් වසර පහක සතුටුදායක සේවාවක් සම්පූර්ණ කර තිබීම

**වැටුප් පරිමාණය :** MM 1-1 - GR 11 - 2016 රු. (53,175-10x1,375-15x1,910 - 95,575) සහ අනෙකුත් රජය අනුමත දීමනාවන්

**වයස :** අවුරුදු 22 ට අඩු නොවිය යුතු අතර අවුරුදු 45 ට වැඩි නොවිය යුතුය. උපරිම වයස් සීමාව අභ්‍යන්තර අපේක්ෂකයන් සඳහා අදාළ නොවේ.

**වෙනත් :**

**සෑම අයදුම්කරුවෙකුම,**

i. ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.

ii. තනතුරට අදාළ කාර්යභාරය තිසිලෙස ඉටුකිරීම සඳහා හා දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා වන කායික හා මානසික යෝග්‍යතාවය තිබිය යුතුය.

iii. විශිෂ්ට චරිතයක් හෙබි අයෙකු විය යුතුය.

- මෙම පත්වීම පිළිබඳව අවසාන තීරණය ගැනීමේ පූර්ණ බලය අධ්‍යක්ෂ මණ්ඩලය සතුය.
- පරිවාස කාලය වසර තුනකි.
- අතිසි බලපෑම් කිරීම අයදුම්කරු නුසුදුස්සෙකු වීමට හේතුවේ.

කරුණාකර ඔබේ ජීව දත්ත, සහතිකවල පිටපත් සමග 2022.11.28 වෙනි දින හෝ ඊට ප්‍රථම ලැබෙන පරිදි ලියාපදිංචි තැපැල් මගින් යොමු කරන්න. අයදුම්පත බහා එවනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම්කරන තනතුර සඳහන් කළ යුතුය.

**සභාපති,**
**ජාතික ලුණු සමාගම,**
**කර්මාන්ත අමාත්‍යාංශය,**
**අංක 561/3, ඇල්විටිගල මාවත, කොළඹ 05.**